## 2.6. නූතන ලෝකය තුළ පූජක දිවිය



පූජකවරයා යනු දෙවියන් වහන්සේ හා මිනිසා අතර මැදිහත්කරුවෙකි. මෙය සෑම ආගමක් තුළම දැකිය හැකි සත්‍යතාවයකි. පුරාණ ගිවිසුම තුළ දෙවියන් වහන්සේ විසින් විශේෂ ලෙස තෝරා පත් කරගන්නා ලද පිරිසක් (වංශයක්) ලෙස පූජකවරුන් දැක්විය හැකි ය. පුරාණ ගිවිසුමෙහි මුලින් ම සඳහන් වන පූජකවරයා මෙල්කිසදෙක් ය.

තව ද සාලෙම්හි රජ වූ පරමෝත්තම දෙවියන් වහන්සේගේ පූජක වූ මෙල්කිසදෙක් රොටී හා මිදි යුෂ ගෙනැවිත් ඔහුට (ආබ්‍රහම්ට) ආශිර්වාද කරමින් 'අහසත්, පොළොවත් මවා වදාළ පරමෝත්තම දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට ආශිර්වාද කරන සේක්වා!, . . . . දෙවියන් වහන්සේට තුති පැසසුම් වේවා!' යි කීවේ ය.

(උත්පත්ති 14:1819)

පැරණි ගිවිසුමේ පූජකවරු ජනතාව වෙනුවෙන් තම යුතුකම් නිසි ලෙස ඉටු කළහ.

උදා: **1. ජනතාව ආසිරි ගැන්වීම (ගණන් කථාව 6:2227)**

**2. ව්‍යවස්ථාවලිය ඉගැන්වීම (2 වංශාවලිය 17:79)**

**3. පුද පූජා ඔප්පු කිරීම (ලෙවී ව්‍යවස්ථාව 9:4)**

නව ගිවිසුම තුළ උත්තම පූජකයාණෝ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය. ඔවුන් වහන්සේගේ පූජකවරය සදාතනික ය.

> ජේසුස් වහන්සේ මෙල්කිසදෙක්ගේ පූජක පිළිවෙළ අනුව සදහට ම උත්තම පූජකයකු වී අප උදෙසා පුරෝගාමියකු වශයෙන් එතැනට පිවිසි සේක.
>
> (හෙබ්‍රෙව් 6:20)

> ඔබ මෙල්කිසදෙක්ගේ පූජක පිළිවෙත අනුව සදහට ම පූජකයෙක් වන සේක.
>
> (හෙබ්‍රෙව් 7:17)

> එබැවින් අහස් මඬල ඉක්මවා ගිය දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් නම් ශ්‍රේෂ්ඨ උත්තම පූජකවරයකු අපට සිටින නිසා, අපේ ඇදහිල්ලේ නොසෙල්වී පවතිමු.
>
> (හෙබ්‍රෙව් 4:14)


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

නව ගිවිසුමෙහි දේව අජබාලකයාණන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තම ජීවිත පූජාව වූ දුක්විඳීම මරණය හා උත්ථානය තුළින් පව්කාරවූ අප උදෙසා යාගික වෙමින් අප උදෙසා දෙවිඳුන් ඉදිරියේ මධ්‍යස්ථ වූ සේක. අහිමි වූ දේව සබඳතාවය යළි උදා කර දෙමින් පූජකයකු මෙන් ම පඬුර ද වූ සේක.

**පොදු පූජකවරය**

උන්වහන්සේ ස්ථාපිත කරන ලද ප්‍රසාද ස්නාපනීය පිළිවෙත (බව්තිස්මස්නාපනය) තුළ සැම කිතුනුවකු ම / විශ්වාසකයෙකු ම ත්‍රිවිධ කැඳවීමක් ලබයි. එනම් රාජකීය, පූජක හා දිවැසිවර යන ත්‍රිවිධ සේවාවට ඇරයුම් ලබා සිටියි. එහෙයින් ප්‍රසාද ස්නාපනය ලැබූ අපි සියල්ලෝ ම පොදු පූජකවරය තුළ අභිෂේක ලබා සිටිමු; ක්‍රිස්තුන් වහන්සේගේ යාගික ක්‍රියාදාමය තුළින්, ගැලවීමදායක ප්‍රේම කිතුනු සංඝය වෙත ගෙන යමින් පාලනය කිරීම, ඉගැන්වීම හා ශුද්ධවන්ත කිරීම යන දේවානුභාවයෙන් පත් කරන ලද පූජක කාර්යයේ නිරතවන ශු. සභාවේ විශේෂ කණ්ඩායමක් වී සිටිමු.

**නිළ පූජකවරය**

උත්තම පූජකයාණන් වන ක්‍රිස්තුන් වහන්සේ තෝරා පත් කළ අපෝස්තුළුවරු පූජකවරය සඳහා විශේෂ ලෙස කැප කරනු ලැබුවෝ වෙති. අපෝස්තුළුවරුන්ගේ ඇවෑමෙන් අද අඛණ්ඩ ව පවත්වාගෙන යන පූජකවරය නිළ පූජකවරය නම් වේ. ඔවුහු ක්‍රිස්තුන් වහන්සේගේ හවුල්කාරයෝ ය.

උදා : ජුදස් වෙනුවට මතියස් තෝරා ගැනීම.

ක්‍රියා 1:2426

**නිළ පූජක ධූර තුනකි.**


රාජගුරු ප්‍රසාදී



රදගුරු



පූජා ප්‍රසාදී



තේවාචාරී

ජුදස් වෙනුවට මතියස් තෝරා ගැනීම තුළින් නව ගිවිසුමෙහි නිල පූජකවරය දනය කිරීම අඛණ්ඩ ව පවත්වාගෙන ගියහ.

| රදගුරුතුමාගේ කාර්යභාරය (ක.ස.ධ. 1554 1561) | පූජකතුමාගේ කාර්යභාරය (ක.ස.ධ. 1562 1568) | තේවාචාරිතුමාගේ කාර්යභාරය (ක.ස.ධ. 1589) |
|---|---|---|
| 1. ශු. සභාව තුළ උගන්වති.<br>2. පාලනය කිරීම.<br>3. ශුද්ධවන්ත කිරීම.<br>4. සියලු ම ප්‍රසාද නිධාන දානය කිරීම. | 1. සුවිශේෂය දේශනා කිරිම.<br>2. සැබෑ එඬේරෙකු වීම.<br>3. දේව වන්දනාව පැවැත්වීම.<br>4. ධර්මෝපදේශය.<br>5. පූජකවරය හැර අනෙක් ප්‍රසාද නිධාන දානය කිරීම. | 1. දේව වාක්‍ය දේශනා කිරීම.<br>2. ප්‍රසාද ස්නාපනය දනය කිරීම.<br>3. දිව්‍ය සත්ප්‍රසාදය බෙදාදීම.<br>4. රදගුරුතුමාට හා පූජා ප්‍රසාදීතුමාට සහාය වීම. |

නිළ පූජකවරය දානය කරනු ලබන්නේ අපේක්ෂකයාගේ හිස මත අත් තබා යාච්ඤා කිරීමෙනි.

පූජා ප්‍රසාදීවරු අතරින් සමහරු පැවිදි දිවිය ද තෝරා ගනිති. ඒ අනුව පදවි පූජක හා පැවිදි පූජකවරුන් ලෙස කණ්ඩායම් දෙකක් දැකිය හැකි ය.

**ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ**
**පූජක හා ගිහි යනුවෙන් සියලු දෙනා දිවි ගෙවති.**

**ඔවුන් සියලු දෙනාගේ ම මූලික අරමුණ හා පරමාර්ථය නම් නව ගිවිසුමේ උත්තම පූජකයාණන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත පූජාව තුළින් අපට හිමිකර දුන් සදාතනික ජීවිතයේ මහිමය, ප්‍රේමය හා පරිත්‍යාගය මඟින් ප්‍රකාශ කිරීමට උපකාරී වීම ය.**

**ජීවිතයේ කුමන කැඳවීම් තත්ත්වයක් තුළ වුව ද එසේ කිරීමට බාධාවක් නො මැත.**

**ඔබගේ අවධානය සඳහා**

- ඔබගේ කැඳවීම කුමක් ද?
- පූජක හා පැවිදි ජීවිතවල වටිනාකම් සොයා දැනගන්න.
- මීසම තුළ ගිහියාගේ දායකත්වය කෙසේ විය යුතු ද?

**අභ්‍යාසඃ**

1. නව ගිවිසුමේ උත්තම පූජකයාණන් වූ ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයේ කැපී පෙනෙන ගුණාංග දහයක් සොයා දක්වන්න.

2. පොදු පූජකවරය තුළ ගිහි කිතුනුවන්ගේ යුතුකම් පහක් ලියා දක්වන්න.


3. ඔබ මීසමේ පූජා ප්‍රසාදිතුමා මුණගැසී එතුමාණන්ගේ සේවාවන් විමසා දැනගන්න.

**වැඩිදුර අධ්‍යයනය සඳහා**

ක්‍රිස්තියානි විශ්වාසකයින් පූජකවරය ලත් අය සහ ගිහි සැදැහැවතුන් ලෙස කොටස් දෙකකට බෙදේ. (සභා නීතිය 207)

මෙම අය අතරින් වෛදහාර දෙමින් තම ජීවිතය කැප කළ පිරිස් ද දැකිය හැකි ය. එම අය පැවිදි හෝ තාපස හෝ නිකායකට අයත් වෙති.

ඒ අනුව;




**ආත්මික නායකයින් වෙත අපගේ යුතුකම් කීපයක්**

- ඔවුන් වෙනුවෙන් යාඥා කිරීම.
- ඔවුන්ට ගෞරව කිරීම.
- මීසමේ සේවාවන්ට සහාය දැක්වීම.
- අවශ්‍යතාවන් සඳහා මූල්‍යමය ආධාර ලබාදීම.
- දේව රාජ්‍යය පතළ කිරීමේ කටයුතුවල දී සහය දැක්වීම.
- ධර්මෝපදේශ සේවාවට සම්බන්ධ වීම.
- තරුණ සමිතිවලට සම්බන්ධ වීම.
- කිතුනු ඒකකවලට සම්බන්ධ වීම.
- යාඥා ඒකක සංවිධානය කිරීම.
- පුදසුන් සේවක සමිතියට සහ ගායනා කණ්ඩායමට සම්බන්ධ වීම.
- ජන වන්දනා කටයුතුවලට සහාය වීම යනාදිය.